යුද්ධ හමුදාධිපති ලේකම් කාර්යාලය
යුද්ධ හමුදා මූලස්ථානය
තැ:පෙ: 553
කොළඹ

හමුදාධිපති/පා/135 (      )

සියළු ස්ථාන (නාවික හා ගුවන් හැර)

2014 දෙසැම්බර් මස 21 දින

**යුද්ධ හමුදා නිලධාරී/සෙසු නිලයින් හට සහනදායී පදනම මත යතුරු පැදි ලබාදීම**

1. අතිගරු ජනාධිපති තුමා විසින් ඉදිරිපත් කළ 2014 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම යටතේ රජයේ දෙපාර්තමේන්තු වල ක්ෂේත්‍ර රාජකාරියේ නියැලෙන රාජ්‍ය නිලධාරීන් විසින් මහජනතාව වෙත ලබාදෙන සේවා තවදුරටත් පුළුල් කිරීමට සහ එමගින් වඩාත් ඵලදායී සේවාවක් ලබාදීමේ අරමුණින් එම අයවළුන් හට යතුරු පැදි ලබාදීම දැනට ආරම්භ කර සිදුකරගෙන යනු ලබයි. ඒ අනුව යමින් යුද්ධ හමුදාවේ රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසු නිලයින් හටද සහනදායී පදනම මත යතුරු පැදි ලබාදීමට තීරණය කර ඇත.

2. මෙහි මූලික අරමුණ වනුයේ දශක 03 ක් පුරා පැවති යුද්ධය සඳහා යුද්ධ හමුදා සාමාජිකයින් ලබාදුන් දායකත්වය, ඉන්පසු කාලය තුලදී රටෙහි සංවර්ධනයට ලබාදෙන දායකත්වය ඇගයීම, යුද්ධ හමුදා නිලධාරී/සෙසු නිලයින්ගේ එදිනෙදා කටයුතු මනා කාර්යක්ෂමතාවයකින් සිදුකර ගෙන යාමට අවැසි රුකුලක් ලබාදීම තුලින් ඔවුන්ගේ මානසිකත්වය ඉහල නැංවීමයි.

**යතුරු පැදි ලබාගැනීම සඳහා අවැසි සුදුසුකම් හා කොන්දේසි**

3. සහනදායී පදනම මත යතුරු පැදි ලබාගැනීම සඳහා අවැසි සුදුසුකම් පහත සඳහන් පරිදි වේ.

අ. 2015.01.15 දිනට තිරුබදු රහිත මෝටර් රථයක් ගෙන්වීමේ බලපත්‍රයක් සඳහා හිමිකම් නොලබන මානි II තනතුරුවල රාජකාරී නියුතු මේජර් නිලයේ සහ ඉන් පහළ සක්‍රිය සේවයේ යෙදී සිටින නිත්‍ය හා ස්වේච්ඡා නිලධාරීන් සහ සෙසු නිලයින්.

ආ. ඉල්ලුම් කරනු ලබන දිනට අවම සේවා කාලය වසර 03 ක් සපුරා තිබීම.

ඇ. කාලාත්‍රයා යුද්ධ හමුදා සේවයේ යෙදී සිටී නම් දෙදෙනාගෙන් එක් අයෙකට පමණක් මේ සඳහා හිමිකම් ඇත.

**මූලික ගෙවීම**

4. සුදුසුකම් ලබන පිරිමි නිලධාරීන්/සෙසු නිලයින් සඳහා රු. 50,000.00 ක් ද කාන්තා නිලධාරිනියන්/සෙසු නිලයින් සඳහා රු. 45,000.00 ක් ද මූලික ලියාපදිංචි ගාස්තු වශයෙන් ගෙවිය යුතුය.

| ඉල්ලුම් කරනු ලබන දිනට ඉදිරි සේවා කාලය | ස්කූටරයක් සඳහා කාන්තා නිලධාරිනියන්/කාන්තා සෙබළියන් | යතුරු පැදියක් සඳහා නිලධාරීන්/සෙසුනිලයින් |
|---|---|---|
| අවම වශයෙන් වසර එකක් හෝ ඊට වැඩි | රු: 45,000.00 | රු: 50,000.00 |
| අවම වශයෙන් වසර එකකට අඩු | රු: 90,000.00 | රු: 100,000.00 |

5. මෙම ගෙවීම ඉඳුරාම සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිදුකල යුතු අතර, ඉන් පසු යතුරු පැදියේ ලියාපදිංචිය ඔහු හෝ ඇය වෙත පවරනු ලබයි.

**<u>යතුරු පැදිය ලියාපදිංචි කිරීම</u>**

6. යතුරු පැදියේ ලියාපදිංචි අයිතිය ඔහු හෝ ඇයගේ පුද්ගලික නමට පැවරෙන අතර, වසර 05 ක් යන තුරු විකිණීම හෝ අන්සතු කිරීම සිදුකල නොහැක.

**<u>නඩත්තුව</u>**

7. යතුරු පැදියේ රක්‍ෂණය, නඩත්තුව සහ වෙනත් අදාල සියළු වියදම් ඔහු හෝ ඇය විසින් පෞද්ගලිකව දැරිය යුතු අතර, ඒ සඳහා වෙනත් දීමනා/ඉන්ධන පහසුකම් කිසිවක් හිමි නැත.

**<u>ක්‍රියාත්මක කිරීමේ පටිපාටිය</u>**

8. මෙම යතුරු පැදි ලබාගැනීම සඳහා හිමිකම් ලබන නිලධාරී/සෙසු නිලයින් මෙයට ඇමුණුම වශයෙන් ඇති අයදුම්පත නිසි අයුරින් සම්පූර්ණ කර ඒකක අණදෙන නිලධාරී, මධ්‍යස්ථාන සේනාවිධායක, රෙජිමේන්තු අධිපති නිර්දේශය සහිතව සුභසාධක අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය. නිසි අයුරු සම්පූර්ණ කරන ලද අයදුම්පත් සඳහා සුභසාධක අධ්‍යක්‍ෂගේ අනුමැතියෙන් පසු ඔහු හෝ ඇය යතුරු පැදියක් ලබාගැනීම සඳහා හිමිකම් ලබයි.

9. මේ සබැඳිව ඔබ යටතේ සිටින සියළුම අයවළුන් දැනුවත් කර මේ සඳහා කැමැත්තක් දක්වන අයවළුන්ගේ නාම ලේඛණයක් 2015.01.15 දිනට ප්‍රථම යුද්ධ හමුදාධිපති ලේකම් කාර්යාලයට පිටපත් සහිතව සුසාඅම වෙත ඉදිරිපත් කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

**කේ ඒ ඩී ඒ කරුණාසේකර ආර්එස්පී යූඑස්පී**
මේජර් ජෙනරාල්
යුද්ධ හමුදාධිපති වෙනුවට

# සහනදායී පදනම මත යතුරු පැදි ලබාගැනීමේ අයදුම්පත්‍රය

උපදෙස් : ඉල්ලුම්පත යතුරු ලියනය කර ඉදිරිපත් කල යුතුය.

## I වන කොටස

(අයදුම්කරු විසින් සම්පූර්ණ කිරීම සඳහා)

1. රෙජිමේන්තු අංකය : ……………………….. නිලය :……………………………….
2. නම : ……………………………………………………………………………………..
3. ඒකකය : ………………………………………………………………………………
4. රාජකාරී ස්ථානයේ ලිපිනය : ………………………………………………………………
5. පෞද්ගලික ලිපිනය : …………………………………………………………………..
6. සේවයට බැඳුනු දිනය : ……………… 8. සේවය අවසන් වන දිනය : ……. ……… …
7. ඉල්ලුම් කරන දිනට ගණනීය සේවය: …………………… දිනට අවු : … මාස :… දින : …….
8. කාලාතුරා යුද්ධ හමුදා සේවයේ යෙදී සිටිද නැද්ද යන වග : ……………………………..
   යෙදී සිටී නම්,
   රෙජි අංකය : …………… නිලය : ………… නම : …………………………………………

මෙහි පහත අත්සන් තබන මම ඉහත සඳහන් ප්‍රකාශය සත්‍ය බවත්, නියම කරන ලද කොන්දේසි වලට වලට එකඟව සහනදායී මිලකට යතුරු පැදිය ලබා ගැනීමට එකඟ වන බව ප්‍රකාශ කරමි.

දිනය : ……………… …………………………

අයදුම්කරුගේ අත්සන

## II වන කොටස

(අයදුම්කරුගේ අණදෙන නිලධාරී විසින් සම්පූර්ණ කිරීම සඳහා)

රෙජි අංකය : …………… නිලය : ………… නම : ……………………………………………
ගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන: …………………………
නම………………………………

දිනය : ………………… (කරුණාකර නිල මුද්‍රාව තබන්න)

## III වන කොටස

(මධ්‍යස්ථාන සේනාවධායක විසින් සම්පූර්ණ කිරීම සඳහා)

රෙජි අංකය : …………… නිලය : ………… නම : ……………………………………………
ගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන: …………………………
නම………………………………

දිනය : ………………… (කරුණාකර නිල මුද්‍රාව තබන්න)

## IV වන කොටස

( රෙජිමේන්තු අධිපති විසින් සම්පූර්ණ කිරීම සඳහා)

රෙජි අංකය : …………… නිලය : ………… නම : ……………………………………………
ගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි

අත්සන: …………………………
නම………………………………

දිනය : ………………… (කරුණාකර නිල මුද්‍රාව තබන්න)

## V වන කොටස

( සුහසාධක අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා)

අංශභාර නිලධාරීගේ සහතිකය

රෙජි අංකය : ............... නිලය : ............ නම : ...........................................................

යන අය රු............... ක මූලික ගෙවීම සිදුකර ඇත/නැත.

අත්සන: ................................

නම....................................

දිනය : .......................

(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

**<u>සුහසාධක අධ්‍යක්ෂගේ අනුමැතිය</u>**

රෙජි අංකය : ............... නිලය : ............ නම : ...........................................................

යන අය වෙත අදාල යතුරු පැදිය ලබාදීම අනුමත කරමි/නොකරමි.

අත්සන: ................................

නම....................................

දිනය : .......................

(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

## VI වන කොටස

එන්ජින් අංක...................................... චැසි අංක ........................................... දරණ ........................................... වර්ගයේ යතුරුපැදිය නිසි අයුරු භාර ගතිමි.

අංකය ......................................

නිලය ......................................

නම ......................................

ඒකකය......................................